


# තේරවිලි



1. තපස් රකිනවා
   කෙතේ ඉන්නවා
   මාළු සොයනවා
   කියන්න මගෙ නම

2. උඩහ ගෙදර මම යනකොට
   අඟර දඟර වැලක් තිබුණා
   මල් සුවඳයි ගෙඩි තිත්තයි
   නොතේරුවොත් ටොකු විස්සයි.

3. ගුලක් බලා රිංගනවා
ඒක ඇතුළෙ කැරකෙනවා
ගේ දොර බඩු රැක දෙනවා
තේරුවොතින් පඩි දෙනවා

4. දත් තිබුණත් කටක් නැතේ
සියලු ම දත් උල්ව ඇතේ
අවුල් ලිහා හැඩ කරතේ
නැති ගෙදරක් ඇත්තෙ නැතේ

5. පිරිසිදුකම කරන අගේ
රැවුල ඉත්තැකූරු වගේ
මිදුල වටේ යන එන කොට
රැවුල ඇඳෙයි පොළොව දිගේ

